
## නිත්තවෙල ගුණයා ගුරුතුමා



හුන්නස්ගිරි කඳු පාමුල දුම්බර මියිවතේ නිත්තවෙල ගම්මානයේදී ක්‍රි.ව. 1906 දී උපත ලද මෙතුමා මුල් යද්දෙස්සලාගෙදර ගුණයා නම් විය. මෙතුමා මහනුවර වටපළුව විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලැබුවේය. මෙතුමා අති දක්ෂ උඩරට නර්තන ශිල්පියෙකි.

උඩරට නැටුම ප්‍රභූ සමාජයේ අවධානයට ලක් නොවූ යුගයක අපේ නර්තනය සමාජයේ අවධානයට ලක් කළේය. එසේම සාම්ප්‍රදායික උඩරට නර්තනය ප්‍රාසාංගික වේදිකාවට ගැලපෙන අයුරින් සකස් කිරීමට මෙතුමා පුරෝගාමී වී ඇත. එපමණක් නොව අපේ උඩරට නර්තනය ජාත්‍යන්තර තලයට ගෙන යෑමටද අපමණ මෙහෙයක් ඉටුකළ මෙතුමා වන්නම් 18 ට අමතරව සමනල වන්නම නිර්මාණය කළේය. ඔහුගේ සේවයට ගරු කරමින් 1950 වසරේ දී එතුමාගේ රුව ඇතුළත් කරමින් මුද්දරයක් නිකුත් කර ඇත. එපමණක් නොව ඔහුගේ සේවය අගය කොට 1975 වර්ෂයේදී මෙතුමාට ජනාධිපති සම්මානයද පිරිනමා ඇත. 1979 දෙසැම්බර් 23 වැනි දින මෙලොවින් සමුගන්නේ භූමිතෙල් කුප්පියක් පෙරළී ඇඳිවතට ගිනි ඇවිළීමෙනි.

## එන්.ඒ. සිරිබෝහාමි ගුරුතුමා



නමින් නාවානේ ආරච්චිල්ලාගේ සිරිබෝහාමි ගුරුතුමා 1913 අගෝස්තු මස 26 වෙනි දින උපත ලබා ඇත්තේ පැල්මඩුල්ල කාමරංගා පිටිය ග්‍රාමයේදී ය. මූලික අධ්‍යාපනය හදාරා ඇත්තේ දිප්පිටිගල ප්‍රාථමික විද්‍යාලයෙනි. ඊට පසුව පන්සල් අධ්‍යාපනය ලබා ඇත. නර්තනයට මෙන්ම දවුල් වාදනයටත්, ගායනයටත් අති දක්ෂයෙකු වූ මෙතුමා ගල්ලෙපිට පනිකාති ගුරුතුමා යටතේ නර්ත ශිල්පය හදාරා ඇත. මීට අමතරව මෙතුමා යන්ත්‍ර මන්ත්‍ර, ගොක් කලාව, වෙස් මුහුණු, කැටයම් කලාව, බලි ඇඹීම ආදී ශිල්ප රාශියක ප්‍රවීනත්වයට පත්විය.

සබරගමුව සම්ප්‍රදායට පමණක් නොව ගැටබෙර, තම්මැට්ටම් හා යක් බෙර වාදනයෙහිද දස්කම් දැක්වීම. ශාන්තිකර්ම මෙන්ම වන්නම් ගායනයේදී ද තම ගායන කුසලතාව විදහා දැක්වූ මෙතුමා, පහන් මඩු, ගී මඩු, හැල්ලුම් මඩු, මංගර පෙළපාලිය, කුමාර සමයම වැනි අංගයන් පිළිබඳව දක්ෂතා ඇත්තෙකි.
එමෙන්ම මෙතුමා,

- කලායතනයක් පවත්වාගෙන යමින් දරුවන්ට සබරගමු නර්තන පිළිබඳ දැනුම හා ප්‍රායෝගික කුසලතා වර්ධනයට අවස්ථාව ලබාදුනි.
- සබරගමුව නර්තනය පාසල් පද්ධතියට ඇතුළු කිරීමට පුරෝගාමී වූවෙකි.

- ශාන්තිකර්ම වලට පමණක් සීමා වී තිබූ සබරගමු නර්තනය ප්‍රාසාංගික කලාවක් බවට පත් කිරීමටත් උගතුන්ගේ හා විචාරකයන්ගේ අවධානයට යොමු කිරීඹටත ඉමහත් වෙහෙසක් දැරීය.
- 1972 දී රාජ්‍ය නර්තන කණ්ඩායමේ සබරගමු අංශයේ ප්‍රධානියා විය.
- උසස් අධ්‍යාපනයට සබරගමු නර්තනය ප්‍රවර්ධනයට ඉමහත් උත්සාහයක් ගෙන ඇත.
- රජයේ නැටුම් හා මුද්‍රා නාට්‍ය විද්‍යාලයේ බාහිර කථිකාචාර්ය වරයෙකු ලෙසද, කටයුතු කර ඇත.

## එස්.එච්. සව්රිස් සිල්වා මහතා



කෑගල්ලේදී 1896 වර්ෂයේ උපත ලැබූ සුවඳ හැන්දිගෙ සව්රිස් සිල්වා මහතා පහතරට දක්ෂ නර්තන ශිල්පියෙකි. සිංහල පාලි සංස්කෘත වැනි භාෂා පිළිබඳව හසල දැනුමක් ඇති මෙතුමා ගුරුවරයෙකි. රජයේ ලලිත කලායතනයේ බාහිර කථිකාචාර්යවරයෙකි. මෙතුමා,

පහතරට නර්තන කලාව ප්‍රචලිත කොට ප්‍රාසාංගික කලාවක් ලෙස නූතන වේදිකාවට ගෙන ඒමටත් කටයුතු කර ඇත.

- 1948 දී ජයන්ති කලායතනය බිහිකොට ශිල්පීන් රැසක් බිහිකිරීමට දායක විය.
- 1958 දෙවන එළසබෙත් රැජින ලංකාවට පැමිණි අවස්ථාවේ පැවැත්වූ ප්‍රසංගයේ ප්‍රධාන නර්තන ශිල්පීය වූයේද මෙතුමාය.
- පහතරට නර්තනය මෙරට පමණක් නොව විදේශීය රටවල ප්‍රචලිත කිරීමට පදනම දැමූයේ මෙතුමාය.
- 1965- "පහතරට නැටුම්" නමින් පහතරට නැටුම් පිළිබඳ ලියැවුණු ප්‍රථම සිංහල ග්‍රන්ථය රචනා කරන ලදි.
- 1971 සූනියම් ශාන්තිය කෘතියද මෙතුමා විසින් රචනා කරන ලද්දකි.
- 1982 දී මෙතුමා අභාවප්‍රාප්ත විය.
- මෙතුමාගේ ඇඳුම් කට්ටලය ජාතික කෞතුකාගාරයේ දැනට තැන්පත් කොට ඇත.

**කාර්ය පත්‍රිකාව**

ඉහත තොරතුරු කියවා පහත වගුව සම්පූර්ණ කරන්න.

| | ශිල්පියාගේ නම | ජීවන තොරතුරු | ශිල්පියාගේ දක්ෂතා | නර්තන කලාවට කළ සේවය | ඔහු අයත් නර්තන සම්ප්‍රදාය |
|---|---|---|---|---|---|
| 1 | | | | | |
| 2 | | | | | |
| 3 | | | | | |